# (ඊ) ගෙවුම් ශේෂය හා විදේශීය වත්කම්

ලංකාවේ ගෙවුම් ශේෂයෙහි සහ විදේශීය වත්කම් පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යා (II) වැනි පරිශිෂ්ටයෙහි 28 සිට 32 තෙක් වූ සංඛ්‍යා සටහන් වලින් දක්වා ඇත. ගෙවුම් ශේෂය පිළිබඳ තොරතුරු ලබා ගෙන ඇත්තේ, වර්ෂය තුළදී වූ නියම ලැබීම් හා ගෙවීම් දක්වෙන විනිමය පාලන සටහන් වලිනි. මෙම තොරතුරු, රේගු වාර්තා පදනම් කොට සැකසුනු, විදේශීය වෙළඳ අංශය විසින් ප්‍රයෝජනයට ගනු ලබන සංඛ්‍යාවන්ගෙන් වෙනස් වේ.

## ප්‍රධාන උපනතීන්

ලංකාවේ ගෙවුම් ශේෂය, 1965 වර්ෂය හා සසඳන විට කැපී පෙනෙන අන්දමින් පිරිහී පැවති බව 1966 වාර්තාව මගින් පෙන්වා දෙන ලදී. භාණ්ඩ වෙළඳාම මගින් වූ අපනයන ඉපැයුම් ප්‍රමාණය රු. දශ ලක්ෂ 235න් අඩු වී රු. දශ ලක්ෂ 1,674 දක්වා පහළ ගිය අතර, ආයාත ගෙවීම් ප්‍රමාණය රු. දශ ලක්ෂ 96 න් වැඩි වී රු. දශ ලක්ෂ 2018 දක්වා ඉහළ ගියේය. අදෘෂ්‍ය භාණ්ඩ ගිණුම ද, ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී පිරිහී තිබුණි. ගෙවුම් ශේෂයෙහි මූලික හිඟය රු. දශ ලක්ෂ 153 ක් පමණ වූ අතර එය පියවනු ලබුයේ රට වෙත ගලා ආ දිගුකාලීන ප්‍රාග්ධනය සහ කෙටිකාලීන වගකීම් රැස් කර ගැනීමෙන් සහ තවදුරටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ද ණය මුදල් ලබා ගැනීමෙනි.

ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වයෙහි පැවති අහිතකර උපනතියන්, 1966 දී කැපී පෙනෙන ලක්ෂණයක් වූ අතර මෙම තත්ත්වය 1967 දී ද පැවතුනි. වෙළඳ කටයුතු මගින් ලැබූ ඉපැයුම්, ප්‍රමාණය තවත් රු. දශ ලක්ෂ 28 න් අඩු වී රු. දශ ලක්ෂ 1,646 දක්වා පැමිණියේය; මෙය, වර්ෂ කිහිපයකින් වූ අඩුම ඉපැයුම් ප්‍රමාණය වුනි; මේ අතර රු. දශ ලක්ෂ 1,997 ක්වූ ආනයන ගෙවීම් ප්‍රමාණය 1966 හා සැසඳීමේදී සැලකිය යුතු ලෙස වෙනස් වූයේ නැත. 1967 භාණ්ඩ වෙළඳම් හිඟය රු. දශ ලක්ෂ 351 ක් (1966 රු. දශ ලක්ෂ 344 හා සැසඳීමේදී) විනි. 1967 දී අදෘෂ්‍ය ගිණුමෙන් ලංකාව ලැබූ ඉපැයුම් පැහැදිලිවම පහළ වැටෙද්දී, ගෙවීම් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලය වූයේ 1966 අදෘෂ්‍ය ගිණුමෙහි පැවති රු. දශ ලක්ෂ 53 අතිරික්තය, 1967 දී රු. දශ ලක්ෂ 21 දක්වා අඩු වීමය. වෙළඳ භාණ්ඩ ගිණුමෙහි හිඟය සමග 1967 අදෘෂ්‍ය ගිණුමේ වූ සුළු අතිරික්තය ගැලපීමෙන් පසු, ලංකාවේ ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමෙහි රු. දශ ලක්ෂ 330 ක හිඟයක් පෙන්නුම් කරයි; මෙය, පසුගිය වර්ෂයේ පැවති හිඟය වන රු. දශ ලක්ෂ 290 හා සැසඳේ.

ලංකාවේ විදේශීය සංචිත ප්‍රමාණය (රන් පවුම් නිදහස් ණය අරමුදල් හැර) 1966 තුළදී රු. දශ ලක්ෂ 126 කට ඉතා කිට්ටු ප්‍රමාණයකින් අඩු වී ගිය අතර, මෙම වත්කම් පවතින පහත් මට්ටමක් ගැන සැලකීමේදී, රු. දශ ලක්ෂ 330 ක තරම් විශාල ප්‍රමාණයක වර්තන ගිණුම්හි හිඟයක් පියවීම පිණිස මෙම වත්කම් යෙදවීමට සිතීම ඉතාමත් අපහසුය. කෙසේ වෙතත්, මෙවැනි අවසථාවකදී 1967 දී ඉපැයූ ආදායමට වඩා සැහෙන තරමකින් ඉහළ ගෙවුම් පරිමාවක් සඳහා මුදල් ලබා ගැනීමට ලංකාවට හැකි වූයේ, රට වෙත ගලා ආ විදේශාධාර හා කෙටි කාලීන ණය මුදල් හේතු කොට ගෙනය.

# සංඛ්‍යා සටහන II (ඵ) 1.
## ලංකාවේ ගෙවුම් ශේෂය (අ)

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | (1) අපනයන (මුළු) | (2) ආනයන (මුළු) | (3) වෙළෙඳ ශේෂය (i) එකතුව | (3) වෙළෙඳ ශේෂය (ii) (එයින් වෙළෙඳ ගනුදෙනු) (ආ) | (4) ශුද්ධ අදිසි (භාණ්ඩ වශයෙන් ලැබුණු තෑගි ඇතුළුව) | (5) ශේෂය වර්තන ගිණුම් හි 3 (1) සහ (4)එකතුව (ශුද්ධ) | (5) ශේෂය එයින් වෙළෙඳ ගනුදෙනු සඳහන් වර්තන ගිණුම් ශේෂය | (6) දිගු කාලීන ප්‍රාග්ධන (ඇ) | (7) මූලික ශේෂය (5) සහ (6) එකතුව (ශුද්ධ) | (8) කෙටිකාලීන ප්‍රාග්ධන (ශුද්ධ) (උ) | (9) වැරදීම් හා අත්හැරීම් | (10) විදේශීය වත්කම්හි වෙනස (වැඩිවීම) + | (11) කාලච්ඡේදය අවසානයේදී මුළු විදේශීය වත්කම් | (12) වත්කම් (රන්පවුම් ණයනිදන් අරමුදල් අත්හැර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 ·· | 1,669 | 1,764 | — 95 | — 45 | — 100 | — 195 | — 127 | — 18 | — 213 | — 1 | — | — 214 | 1,062 | 973 |
| 1958 ·· | 1,624 | 1,713 | — 89 | — 11 | — 64 | — 153 | — 119 | + 8 | — 145 | — 38 | — 16 | — 129 | 933 | 838 |
| 1959 ·· | 1,773 | 1,985 | — 185 | — 49 | — 23 | — 208 | — 66 | + 32(ඉ) | — 176 | — | + 1 | — 175(ඉ) | 734 | 655 |
| 1960 ·· | 1,796 | 2,006 | — 210 | — 127 | — 10 | — 220 | — 63 | + 22 | — 198 | — 24 | + 29 | — 193 | 541 | 458 |
| 1961 ·· | 1,707 | 1,794 | — 87 | — 5 | — 7 | — 95 | — 48 | + 11 | — 84 | + 93(ඊ) | — 19 | — 9 | 532 | 441 |
| 1962 ·· | 1,763 | 1,906 | — 143 | — 47 | + 3 | — 140 | — 81 | + 39 | — 101 | + 42(ඊ) | + 31 | — 28 | 504 | 407 |
| 1963 ·· | 1,708 | 1,869 | — 161 | — 27 | — 7 | — 168 | — 78 | + 80 | — 88 | + 42 | + 4 | — 42 | 462 | 359 |
| 1964 ·· | 1,767 | 1,960 | — 193 | — 39 | + 33 | — 160 | — 82 | + 69(ඉ) | — 92 | + 33 | — 8 | — 51(ඉ) | 351 | 305 |
| 1965 ·· | 1,909 | 1,922 | — 13 | + 128 | + 72 | + 59 | + 136 | + 58(ඉ) | + 117 | + 3(ඊ) | — 6 | + 114(ඉ) | 440 | 408 |
| 1966 ·· | 1,674 | 2,018 | — 344 | — 120 | + 53 | — 290 | — 130 | + 137 | — 153 | + 53(ඊ) | — 22 | — 122 | 318 | 282 |
| 1967(උ) | 1,646 | 1,997 | — 351 | — 89 | + 21 | — 330 | — 121 | + 161 | — 176 | + 277(ඊ) | + 30 | + 131 | 449 | 407 |

(අ) විදේශීය ගෙවුම් හා ලැබීම් පිළිබඳ විනිමය පාලන සංඛ්‍යා තොරතුරු පදනම් කොට.

(ආ) පහත සඳහන් දෑ ඇතුලත්ය. (1) වෙළෙඳ බැංකුවල විදේශීය විනිමය ගනුදෙනු, (2) වෙළෙඳ බැංකුවෙහි බහිවාසික ගිණුම් (3) මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු. (4) ගෙවුම් ගිවිසුම් ගනුදෙනු සහ (5) විශේෂ ගිණුම් පහසුකම් භුක්ති විඳින සමාගම් (එනම්, රන්පවුම් වැවිලි සමාගම් සහ වෙළෙන්දන්ගේ ගිණුම්).

(ඇ) පෞද්ගලික සහ රජයේ දිගු කාලීන ශුද්ධ සංචලන ඇතුළත් වේ. බැර සංඛ්‍යා මෙසේය. 1957 රුපියල් දශලක්ෂ 23; 1958 රුපියල් දශලක්ෂ 23; 1959 රුපියල් දශලක්ෂ 42; 1960 රුපියල් දශලක්ෂ 27; 1961 රුපියල් දශලක්ෂ 24, 1962 රුපියල් දශලක්ෂ 46; 1963 රුපියල් දශලක්ෂ 82; 1964 රුපියල් දශලක්ෂ 79; 1965 රුපියල් දශ ලක්ෂ 80; 1966 රුපියල් දශලක්ෂ 189; සහ 1967 රුපියල් දශලක්ෂ 219;

(ඈ) ද්විපාර්ශ්වීය වෙළෙඳ හා ගිවිසුම් යටතේ වගකීම්වල වෙනස්වීමද, ජනනීති 480 ප්‍රතිපාර්ශ්වීය අරමුදල් වෙළෙඳ බැංකුවල විදේශීනට ඇති වගකීම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ශුද්ධ මුදල් ඇතුළත් වෙයි. 1964, 1965, 1966, සහ 1967 සංඛ්‍යාවනට සහල් ආනයන සඳහා බුරුමයට දියයුතු ප්‍රමාණය ඇතුළත් වෙයි.

(ඉ) 1959 රුපියල් දශලක්ෂ 24 ක්ද, 1964 රුපියල් දශලක්ෂ 60 ක්ද, 1965 රුපියල් දශලක්ෂ 25 ක්ද ප්‍රධාන වශයෙන් ස්ටර්ලින් ණය අරමුදල් වලින් ආපසු ගෙවන ලද ස්ටර්ලින් ණය ඇතුළත් නොවේ.

(ඊ) 1961 සහ 1962 දී රුපියල් දශලක්ෂ 53·8 බැගින් හා 1965 දී රුපියල් දශලක්ෂ 109·4, 1966 දී රුපියල් දශලක්ෂ 144·0 හා 1967 දී රුපියල් දශලක්ෂ 122·6 ක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් මුදල් ඇතුළත්ය. එයින් කලින් ලබා ගන්නා ලද ණය මුදල්වල නැවත ගෙවීම් වන 1965 රු. දශලක්ෂ 35·7 ද, 1966 රු. දශලක්ෂ 53·6 හා 1967 රු. දශලක්ෂ 17·9 ද අඩුකොටය; තවද, 1965 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ සලාකය, ඩොලර් දශලක්ෂ 45 න් ඩොලර් දශලක්ෂ 62 දක්වා වැඩිවීම සහ 1966 දී ඩොලර් දශලක්ෂ 78 දක්වා වැඩිවීම හේතුකොටගෙන, 1965 සහ 1966 දී පිළිවෙළින් දක්නට ලැබුණු රු. දශලක්ෂ 20·2 සහ රු. දශලක්ෂ 19·0 ක්වූ රන් දීමනා අඩුකොටය.

(උ) තාවකාලිකයි.

මෙයින් ප්‍රධාන වූයේ ජාත්‍යන්තර අරමුදලය. 1967 දී මෙවැනි සම්පත් ප්‍රමාණයක් ලංකා ආර්ථික ක්‍රමයට නොලැබුනේ වී නම්, එකම තේරීම විය හැකිව තිබුණේ ආර්ථික කටයුතුවල අවනතියකට හා ආර්ථික වර්ධන අනුපාතයෙහි පිරිහීමකට මුහුණ දීමයි. ඇත්ත වශයෙන් පසුගිය වර්ෂ කිහිපය තුළ වූ ආර්ථික වර්ධන අනුපාතිකය, වාර්ෂික ජන සංඛ්‍යා වර්ධනයට සරිලන සහ රටේ වැඩිවන ශ්‍රම හමුදාව ඇද ගැනීම අතින් යන්තමින් ප්‍රමාණවත් විය. කෙසේ වෙතත්, 1967 දී වූ ධෛර්‍යය ගෙන දෙන සුළු ලක්ෂණයක් වූයේ, විදේශීය සම්පත් වලින් වැඩි ප්‍රමාණයක් ඵලදායී කටයුතු සඳහා යොමු කිරීම සහ ආනයන ආයෝජන භාණ්ඩ සහ අමු ද්‍රව්‍ය භාණ්ඩ වලට වැඩි තැනක් දෙමින් ආනයන අය වැය ලේඛනය හැඩ ගැසීමට හිතා මතා ප්‍රයත්න කිරීමක්ය; මෙය මතු ඡේදයන් මගින් සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

**විදේශීය සම්පත් සහ ඒවා ප්‍රයෝජනයට ගැනීම.**

1967 දී ලංකාවේ පැවති මුළු විදේශීය සම්පත් ප්‍රමාණය රු. දශ ලක්ෂ 2,393 ක් විය. මෙය 1966 පැවති සම්පත් ප්‍රමාණයට වඩා රු. දශ ලක්ෂ 12 කින් අඩුය. 1966, අපනයන ඉපැයුම් ප්‍රමාණය වූ රු. දශ ලක්ෂ 1,674, රු. දශ ලක්ෂ 1,646 දක්වා පහළ වැටීමත්, 1966 අදෘශ්‍ය භාණ්ඩ ඉපැයුම් ප්‍රමාණය වූ රු. දශ ලක්ෂ 204, 1967 දී රු. දශ ලක්ෂ 198 ට පහළ වැටීමක් සිදු වුවත්, 1966 දී විදේශීය සම්පත් සංචලනය කළා වූ මට්ටමටම 1967 දී හැකි වූයේ, මූලික වශයෙන් බලතොත්, රට තුළට ප්‍රාග්ධන ගලා ඒම වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙනි. දිගු කාලීන ප්‍රාග්ධන ගලා ඒම් 1966 පැවති රු. දශ ලක්ෂ 226 සිට රු. දශ ලක්ෂ 261 දක්වා 1967 දී වැඩි වූ අතර, මෙ මගින් එය ලංකාවේ එම වර්ෂයේ විදේශීය සම්පත් වලින් සියයට 11 ක ප්‍රමාණයක් සැපයීය; 1965 සහ 1966 හා සැසඳීමේදී මෙය, පිළිවෙලින් සියයට 6 සහ 9 විය. මෙම මුළු දිගු කාලීන ප්‍රාග්ධන ප්‍රමාණයෙන්, ණය මුදල් වටිනාකම 1966 දී රු. දශ ලක්ෂ 173 සිට රු. දශ ලක්ෂ 212 දක්වා 1967 දී වැඩි වූ අතර, දීමනාවල වටිනාකම 1966 පැවති රු. දශ ලක්ෂ 51 සිට රු. දශ ලක්ෂ 46 දක්වා 1967 දී පහළ වැටුනි. ඇත්තෙන්ම මෑත අවුරුදුවලදී ලංකාවට ආ ප්‍රාග්ධන ගලා ඒම්වල සැලකිය යුතු ලක්ෂණයක් වූයේ, මුළු ආධාර ගලා ඒම් වලින් ණය මුදල් කොටස වැඩිවීමත්, දීමනා ප්‍රමාණය අඩුවීමත්ය; මෙ මගින්, අනාගත වර්ෂවලදී ලංකාවේ ණය මුදල් හා පොලී ආපසු ගෙවීමේ හැකියාවට බලපානු ඇත. මෙසේ 1965 මුළු ප්‍රාග්ධන ගලා ඒම් වලින් සියයට 55 ක්වූ ණය මුදල් ප්‍රමාණය 1967 දී, සියයට 81 ක්වූ අතර, මේ කාලච්ඡේදයන්හිම දීමනා ප්‍රමාණය සියයට 45 සිට සියයට 18 දක්වා අඩු වී ඇති බව පෙනේ.

මෑත අවුරුදුවල ලංකාවේ ගෙවීම් හිඟයක් පියවීමේ තවත් වැදගත් ලක්ෂණයක් වූයේ කෙටි කාලීන වගකීම් සමුච්චය කිරීමට වැඩියෙන් පෙළඹීමයි. ප්‍රධාන වශයෙන් ම වර්ෂ 5 ට අඩු පරිණත වීමේ රටාවකින් යුතු ණය සම්බන්ධයෙන් මෙය පෙනින මෙවැනි කෙටි කාලීන වගකීම්හි ප්‍රධාන කොටස සැකසී ඇත්තේ, දැනට රු. දශලක්ෂ 470·2 ක (ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 79·0) මුළු ණය ප්‍රමාණයක් ඇති ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙන් ගත් ණය වලිනි. මෙයින් රු. දශ ලක්ෂ 92·8 ක් (හෙවත් ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 19·5) හැර ගෙන ඇත්තේ, අපනයන ඉපැයුම්හි උච්චාවචනය වීම් සඳහා වූ, අන්තර් ජාතික මුල්‍ය අරමුදලේ ''වන්දි පියවීමේ ක්‍රමය''

මගිනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් ගැනීම් මගින්, පසුගිය වර්ෂ 3 තුළදී සැලකිය යුතු ප්‍රමාණයක විදේශීය සම්පත් ප්‍රමාණයක් නොකඩවා සැපයුනි. මෙම ප්‍රමාණය 1965 දී රු. දශ ලක්ෂ 109 ක්ද, 1966 දී රු. දශ ලක්ෂ 144 ක්ද, හා 1967 දී රු. දශ ලක්ෂ 123 ක්ද විය.[1] 1967 දී ලංකාවේ විදේශීය සම්පත් ප්‍රමාණයට තවදුරටත් එකතු වූයේ, ද්විපාර්ශ්වීය ගෙවීම් ගිවිසුම් ගිණුම් යටතේ වූ ණයවීම් ප්‍රමාණය රු. දශ ලක්ෂ 80 කින් වැඩිවීමෙන් සහ විදේශ බැංකු වලින් ලබාගත් රු. දශ ලක්ෂ 57 ක කෙටි කාලීන ණය ගැනීම් වලිනි. මේ නිසා, සාරාංශ වශයෙන් බල තොත් 1967 දී ලංකාව පැවති විදේශීය සම්පත් ප්‍රමාණයෙන්, ඉපැයූ සම්පත් වලින් ලැබුනේ සියයට 75 ක් පමණි: සම්පත් වලින් සියයට 23 ක්, නොයෙකුත් කෙටි හා දිගු කාලීන ණය ගැනීම් වැඩ පිළිවෙලවල් මගින් ලබා ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් අපනයන වල සාමාන්‍ය මිල පිරිහීමත්, ආනයන ආදායම් පැහැදිලි ලෙස පහළ යාමත්, එසේම ආනයන ප්‍රමාණය ඉහළ යාමත්, ගෙන බලන කල, මෙය නොවැළැක්විය හැකිය; ආනයන ඉහළ යාම අවශ්‍ය වූයේ, 1964 දී, එය ඉතා පහළ මට්ටමකට වැටී මෙන් පසු-මෙය ද අහිතකර ලෙස වෙළඳ අනුපාතය වෙනස් වීම නිසා සිදු වූවකි. ආර්ථික කටයුතු වල වේගය ඉහළ නැංවීම සඳහාය.

පසුගිය වර්ෂවලදී මෙන්ම 1967 දී ද ලංකාවට තිබුන රු. දශ ලක්ෂ 2393 ක විදේශීය සංචිත වලින් පහෙන් සතරකට වැඩි ප්‍රමාණයක් යොදා ගනු ලැබුයේ වෙළඳ භාණ්ඩ ආනයනයන් මිළදී ගැනීමටය. මෙම ආනයනයන් අතුරින් සියයට 13 ක් විදේශීය ආධාර වලින් මිළදී ගත් අතර 1965 සහ 1966 දී මෙය, පිළිවෙලින් සියයට 7 සහ 11 ක් විය. කෙසේ වෙතත් ආනයන සැලැස්ම, ආයෝජන භාණ්ඩ හා අමුද්‍රව්‍ය වලට නැඹුරුව හැඩගැස්වීම, ඉපයුම් මගින් හා ආධාර වශයෙන් ලැබුන සම්පත් විසදම් කල ආකාරයෙහි දක්නට ලැබුනි. ආනයන රටාවෙහි සිදු වූ මෙවැනි වෙනස් කම් මගින්, නිෂ්පාදන ව්‍යුහය වෙත දැක් වූ බලපෑම, දේශීය ප්‍රයෝජනයට නිමවන ආනයන නොවන කෘෂිකර්ම අංශයේ හා කාර්මික අංශයේ නිෂ්පාදනය වැඩිවීම කෙරෙන් පෙනී යයි. නිදසුනක් වශයෙන්, 1967 දී කෘෂිකාර්මික යෙදවුම් වන පොර, ට්‍රැක්ටර් හා අනිකුත් ප්‍රවාහන උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ කාර්මික අමු ද්‍රව්‍ය වැනි ආනයනවල පැහැදිලි වැඩිවීමක් දක්නට ලැබුනි 1967 තුළදී රටට විදේශීය ආධාර වැඩියෙන් ගලා ඒමෙන් ආයෝජන හා අමු ද්‍රව්‍ය ආනයන ගෙන්වීම වඩා පහසු කළා ඇරෙන්නට 1967 දී පැරණි ණය මුදල් සේවා කිරීමට වෙන් වූ සම්පත් ප්‍රමාණය සහ අදෘෂ්‍ය ගිණුමෙහි ගෙවීම් ප්‍රමාණය අඩුකර ගැනීමට හැකිවීම නිසා, ප්‍රාග්ධන ගිණුමෙහි සැලකිය යුතු සහනයක් ලබා ගත හැකි විය. අදෘෂ්‍ය භාණ්ඩ වෙනුවෙන් වූ ගෙවීම් සම්බන්ධයෙන්, සලකා බැලීමේදී ද ආයෝජන ආදායම් හා පොලී ගෙවීම් පිළිබිඳ වූ ගලා යාමෙහි වැඩිවීමක් දක්නට තිබූ අතර, එය රට හැර යන්නන් ගේ පැවරීම් අඩු වීමෙන්, තරමක් දුරට හිලව් කරනු ලැබිය. පැරණි ණය මුදල් ක්‍රමක්ෂය සඳහා යෙදවුනු සම්පත් ප්‍රමාණයෙහි ද පැහැදිලි අඩු වීමක් තිබුණි; කෙසේ වුවද, මෙය, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කල ගැනීම් වෙනුවෙන්, කල යුතු ගෙවීම්වල සැලකිය යුතු අඩුවීමක් 1967 සිදුවීම නිසාය.

---

1. මෙම මුදල් පරිවර්තනය කරනු ලැබුයේ පූර්ව අවප්‍රමාණිත විනිමය අනුපාතිකයට අනුවය; මෙම ගැනීම් සියල්ල ලබා ගනු ලැබුයේ 1967 නොවැම්බර් 22 වැනිද ලංකා රුපියල සියයට විස්සකින් අව ප්‍රමාණය කිරීමට පෙරාතුවය.

## සංඛ්‍යා සටහන II (ඒ) 2
## විදේශීය මුදල් මාර්ග සහ ඒවා යෙදවූ අයුරු

| | රුපියල් දශ ලක්ෂ | | | කොටස්වල සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | 1965 | 1966 | 1967 |
| **(අ) මුදල් මාර්ග** | | | | | | |
| 1. වෙළඳ භාණ්ඩ අපනයන නැ.වි.ස. .. | 1,909 | 1,674 | 1,646 | 81 | 70 | 69 |
| 2. ජංගම අදිසි .. | 199 | 204 | 198 | 8 | 9 | 8 |
| 3. ප්‍රාග්ධන ලැබීම .. | 141 | 226 | 261 | 6 | 9 | 11 |
| ඒවායින්— | | | | | | |
| (අ) ණය1 .. | 77 | 173 | 212 | 55 | 77 | 81 |
| (ආ) දීමනා1 .. | 64 | 51 | 46 | 45 | 23 | 18 |
| (ඇ) පෞද්ගලික ප්‍රාග්ධනය .. | — | 2 | 3 | — | — | 1 |
| 4. කෙටි කාලීන වගකීම් .. | 109 | 175 | 288 | 5 | 7 | 12 |
| ඒවායින්— | | | | | | |
| (අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීම් (දළ)2 .. | 109 | 144 | 123 | 100 | 82 | 43 |
| (ආ) ද්වි පාර්ශ්වීය ගෙවීම් ගිවිසුම් ශේෂයේ වැඩිවීම .. | — | 31 | 80 | — | 18 | 28 |
| (ඇ) විදේශීය බැංකුවලින් ණය ගැනීම් .. | — | — | 57 | — | — | 20 |
| (ඈ) අනෙකුත් .. | — | — | 28 | — | — | 9 |
| 5. විදේශීය වත්කම් අඩුවීම (රන්පවුම් ණය නිදන් අරමුදල් අඩු කොට) .. | — | 126 | — | — | 5 | — |
| එකතුව .. | 2,359 | 2,405 | 2,393 | 100 | 100 | 100 |
| **(ආ) යෙදවූ අයුරු** | | | | | | |
| 6. වෙළඳ භාණ්ඩ ආනයන මි.ර ගැ .. | 1,922 | 2,018 | 1,997 | 81 | 84 | 83 |
| ඒවායින් ආධාර .. | 142 | 224 | 258 | 7 | 11 | 13 |
| 7. ජංගම අදිසි .. | 199 | 213 | 217 | 8 | 9 | 9 |
| (අ) ආයෝජන ආදායම .. | 4 | 26 | 34 | 2 | 12 | 16 |
| (ආ) සංක්‍රමිකයන්ගේ පැවරීම් .. | 31 | 32 | 30 | 16 | 15 | 14 |
| (ඇ) පොලී ගෙවීම් .. | 22 | 21 | 24 | 11 | 10 | 11 |
| 8. ප්‍රාග්ධන ක්‍රමක්ෂය හෝ ආපසු ගෙවීම් .. | 75 | 114 | 21 | 3 | 5 | 3 |
| (අ) පෞද්ගලික .. | 3 | 8 | 8 | 4 | 7 | 11 |
| (ආ) නිල .. | 16 | 30 | 45 | 21 | 26 | 63 |
| (ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ප්‍රතිමිලට ගැනීම් හා රත්රන් දායක මුදල් දීමනා · | 56 | 76 | 18 | 75 | 67 | 26 |
| 9. කෙටි කාලීන වගකීම්3 .. | 69 | 62 | — | 3 | 2 | — |
| 10. විදේශීය වත්කම් වැඩිවීම (රන් පවුම් නිදන් අරමුදල් අඩු කොට) .. | 103 | — | 125 | 5 | — | 5 |
| 11. ශිර්ෂ තුලනය .. | —9 | —2 | —17 | — | — | — |
| එකතුව .. | 2,359 | 2,405 | 2,393 | 100 | 100 | 100 |

1. යෝජනා ක්‍රම ආධාර හා භාණ්ඩ ආධාර වශයෙන් ලැබුණු ණය මුදල් ඇතුළත්ය.
2. ලංකාවේ සලාකය ඩොලර් දශ ලක්ෂ 45 සිට 1965 දී ඩොලර් දශ ලක්ෂ 62 වද, 1966 දී ඩොලර් දශ ලක්ෂ 78 වද වැඩි කිරීම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් 1965 රුපියල් දශලක්ෂ 20 ක් හා 1966 දී රුපියල් දශ ලක්ෂ 19 ක් වශයෙන් ලබා ගත් රත්රන් දීමනා ඇතුළත්ය.
3. 1966 වර්ෂයේ කෙටි කාලීන වගකීම් ද්වි පාර්ශ්වීය ගෙවීම් ගිවිසුම් ශේෂ අඩුවීමකින් විශේෂ ගිණුම් පහසුකම් භුක්ති විඳින වෙළඳ ආයතනවල ශේෂ වෙනස් වීමකින් හා රජය විසින් ආනයනය කැරුන ආහාර වෙනුවෙන් වූ විලම්බිත ගෙවුමකින් සමන්විත වෙයි.

## 1967 විස්තරාත්මක උපනතීන්

### (අ) වෙළඳ භාණ්ඩ ගිණුම[1]

1967 වෙළඳ භාණ්ඩ ගිණුමෙහි ශේෂය, 1966 රුපියල් දශ ලක්ෂ 344 ක හිඟය හා සැසඳීමේදී, රුපියල් දශ ලක්ෂ 351 ක හිඟයක් පෙන්නුම් කළේය. වැඩි වූ මෙම වෙළඳ හිඟය පියවනු ලැබුයේ, 1967 දී රුපියල් දශ ලක්ෂ 258 දක්වා, රුපියල් දශ

1. මෙම විශ්ලේෂණය පදනම් වී ඇත්තේ, වර්ෂය තුල වූ නියම ලැබීම් හා ගෙවීම් පිළිබඳ විනිමය පාලන සටහන් මතය.

ලක්‍ෂ 34 කින් ඉහල ගිය විදේශාධාර ගලා ඒම් මගිනි. වෙළඳ භාණ්ඩ ගිණුමෙහි වාණිජ ගණුදෙනු සම්බන්ධයෙන් වූ හිඟය රුපියල් දශ ලක්‍ෂ 89 ක්වූ අතර, මෙය, 1966 දී වූ, රුපියල් දශ ලක්‍ෂ 120 ක්වූ හිඟය හා සැසඳේ. 1967 දී ලංකාවේ විදේශ වත්කම් වලින් හැර ගැනීම් නොවූ බැවින්, වාණිජ ගිණුමෙහි හිඟය පියවනු ලැබුයේ ප්‍රධාන වශයෙන්, ද්විපාර්ශ්වීය ගෙවීම් ගිණුමෙහි වගකීම් සංචිත වැඩිවීමේ හේතුවෙන් ඉහල ගිය, කෙටි කාලීන වගකීම් මගිනි.

1966 දී වෙළඳ භාණ්ඩවල අපනයන වටිනාකම රුපියල් දශ ලක්‍ෂ 1,674 දක්වා, රුපියල් දශ ලක්‍ෂ 235 කින් අඩු විය. 1967 දී තවදුරටත් එහි වටිනාකම, රුපියල් දශ ලක්‍ෂ 1,646 දක්වා රුපියල් දශ ලක්‍ෂ 28 කින් අඩු විය. 1966 හා සසඳ බලන කල, 1967 දී ද අපනයන වටිනාකම් පහල බැසීමට ප්‍රධාන හේතුව වූයේ ලංකාවේ ප්‍රධාන අපනයන ද්‍රව්‍යයන් වන තේ, පොල්, රබර්, වල සාමාන්‍ය මිළ පහල වැටීමය.

1967 දී තේ සඳහා වූ සාමාන්‍ය නැ. වි. ස. මිල තවදුරටත් රාත්තල රු. 2·22 දක්වා සියයට 4·7 කින් පහල වැටුණු අතර, රබර්වල සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 14·2 කින් රාත්තල ශත 97 දක්වා පහල වැටිණි. 1967 දී පොල් තෙල් සඳහා වූ සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 11·7 කින්, ටොන් එකක් රුපියල් 1,314 දක්වා පහල වැටුණි. කොප්පරා සහ කපාපු පොල් වල මිලෙහි සුළු වශයෙන් පහල වැටීමක් දක්නට තිබුණි. ලංකාවේ ප්‍රධාන අපනයනයන්ගේ මිලෙහි මෙම අඩුවීම්, බොහෝ දුරට, 1967 දී ලෝක වෙළඳ පොලෙහි මූලික භාණ්ඩ සඳහා වූ අසතුටුදායක තත්ත්වයන් නිරූපනය වීමක් විය. විදේශීය රටවල දේශපාලන නොසන්සුන් තාවයක්, මිළදී ගනු ලබන සමහර ප්‍රධාන මධ්‍යස්ථානයන්හි විශාල වශයෙන් තොග පැවතීමත්, සමහර ප්‍රධාන කාර්මික රටවල ආර්ථික ක්‍රියාවලියන්හි අඩුවීමත්, ඉතා කිට්ටු ආදේශන ද්‍රව්‍ය නිපදවීමත්, සමස්ථ ලෝකයේම මෙම ද්‍රව්‍යවල සැපයීම වැඩි වීමත්, සමහර අවස්ථාවලදී තොග නිකුත් කිරීම වේගවත් ලෙස සිදු වීමත් යන කරුණු සියල්ලම 1967 ලංකාවේ මූලික අපනයන ද්‍රව්‍යයන්ගේ මිල උපනතියන් අවුල් තත්ත්වයකට පත්කිරීම කෙරෙහි සෑහෙන දුරකට බලපෑවේය.

ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය වැඩිවීම නිසා, නිපැයුම වැඩිවීමෙන්, ලංකාවට පසුගිය වර්ෂ කිහිපය තුළ ඇයගේ ප්‍රධාන අපනයන ද්‍රව්‍යයන් සඳහා වූ අයහපත් මිල උපනතියන්ගෙන් වන පාඩුව, සුළු වශයෙන් පියවා ගැනීමට හැකි විය. කෙසේ නමුත්, අයහපත් කාලගුණ තත්ත්වයන් බොහෝ දුරට බලපෑම නිසා, තේ සහ පොල් සඳහා වූ අයහපත් මිල තත්ත්වයන්ගෙන් වන පාඩුව, සැලකිය යුතු ප්‍රමාණ යකින් 1967 දී, නිෂ්පාදනය වැඩි කොට පිරිමසා ගැනීමට අපොහොසත් විය. කෙසේ නමුත්, 1966 වර්ෂය හා සසඳ බලන කල අපනයනය කළ තේ ප්‍රමාණය වැඩි වූ නමුත්, මේ වැඩිවීම සිදුවූයේ රැස් කල තොග ප්‍රමාණය අඩු වීමෙනි. මෙවැනි රැස් කල තොග අඩුවීමක් සිදු නොවූයේ නම්, 1966 පැවැති මට්ටමට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අපනයනය කළ තේ වල වටිනාකම පහල වැටීමට ඉඩ තිබුණි. නිපැයුම අඩුවීමත් සමගම මිල මට්ටම ද පහල වැටීම හේතු කොට ගෙන, අපනයනය කළ පොල් ප්‍රමාණයත්, එයි වටිනාකමත් පහළ වැටිණි. ප්‍රධාන වශයෙන් පොල් වගා කරනු ලබන ප්‍රදේශයන්හි 1967 දී ඇති වූ සුළිසුළඟ, අපනයන ප්‍රමාණයන් පහල දැමීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයක් විය. පසුගිය වර්ෂය හා සසඳ බලන කල, කෙසේ වුවද, 1967 දී රබර් නිපැයුම සියයට 9·3 කින් වැඩි විය. එනමුත්, දේශීය පාරිභෝජනය වැඩිවීම හේතු කොට ගෙනත්, කම්කරු හා නැව් කටයුතුවල පැවැති දුෂ්කරතාවයන් හේතු කොට ගෙනත්, අපනයනය කළ හැකි තොග රැස්වීම නිසාත්, අපනයන ප්‍රමාණයන් සියයට 2·3 කට ආසන්න ප්‍රමාණයකින් පහල වැටිණි.

1967 දී ආනයනය කළ වෙළඳ භාණ්ඩ වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1997 ක් වූ අතර, එම වටිනාකම 1966 ආනයන ද්‍රව්‍ය වල වටිනාකමට වඩා රුපියල් දශ ලක්ෂ 21 කින් අඩු විය. 1966 හා සසඳ බලන කල, 1967 අපනයන සඳහා පැවති අනාගත අපේක්ෂාවන් එතරම් සතුටුදායක නොවූ හෙයින්, 1967 වර්ෂය සඳහා ආනයන කපා හැරීම අවශ්‍ය විය. මෙයට තවදුරටත් හේතු වූයේ නිදහස් ලෙස උපයෝගී කොට ගත හැකි විදේශීය විනිමය සංචිත, 1967 තවදුරටත් උපයෝගී කොට ගත නොහැකි මට්ටමක පැවතීමය. මේ අනුව, 1967 දී ආනයනය කළ වෙළඳ භාණ්ඩ වල වටිනාකම, උපයා ගත් විදේශීය විනිමය සම්පත් වලින්, රුපියල් දශ ලක්ෂ 1739 පමණක් වූ අතර, 1966 හා සසඳ බලන කල ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1794 ක්වූ බවත් පෙනී යයි. මේ තත්ත්වය යටතේ කෙසේ නමුත්, වෙළඳ භාණ්ඩ ගිණුමෙන් 1967 දී ගෙවන ලද ගෙවීම් ප්‍රමාණය, ශුද්ධ අදෘශ්‍යයන්ගෙන් සහ අපනයනයන්ගෙන් උපයාගත් වර්තන ඉපයීම් ප්‍රමාණයට වඩා වැඩි විය. මෙම හිඟය, ලැබුන ආධාර වලින් ද, ද්විපාර්ශ්වික ගෙවීම් සම්මුති යටතේ රැස් කරගනු ලැබූ වගකීම් වලින් සහ වෙනත් කෙටි කාලීන ණය ගනුදෙනු මාර්ගයෙන් ද පියවා ගන්නා ලදී.

ආයෝජන භාණ්ඩ හා අමු ද්‍රව්‍ය ආනයනය වැඩිවීමත්, ආනයනය කරනු ලබන පාරිභෝජන භාණ්ඩ වල, විශේෂයෙන්ම ආනයන ආදේශක වශයෙන් වඩියෙන් දියුණුකල හැකි භාණ්ඩ වල ප්‍රමාණය අඩු වීමත් වශයෙන් සිදු වූ කැපී පෙනෙන වෙනස්කම්, 1967 ආනයන සැකැසුමේ ධෛර්‍ය ගන්වන සුළු ලක්ෂණය වීය. ආනයන ආදේශක කර්මාන්ත සහ කෘෂි කර්මාන්ත අංශයන්හි නිපැයුම් ප්‍රමාණය පුළුල් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සහ පරීක්ෂාකාරී විදේශීය විනිමය අයවැය කරණයෙන් මෙම වෙනස සිදු කරන ලදී. මෙම අංශයන්හි නිපැයුම අධික වීම නිසා, 1967 දී සහ ඊට ඉහත වර්ෂයන්හි දී අමු ද්‍රව්‍ය සහ ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වැඩියෙන් මුදල් වෙන් කිරීමට පහසුකම් සැලසින. මේ අනුව 1967 ආනයනය කරන ලද ආහාර පාන වල වටිනාකම, රුපියල් දශ ලක්ෂ 797 දක්වා, රුපියල් දශ ලක්ෂ 15 කට ආසන්න ප්‍රමාණයකින් පහළ වැටුණු බව පෙනේ. මෙම ප්‍රභේදය යටතේ ආනයනය කරන ලද හාල් වල වටිනාකම පමණක් රුපියල් දශ ලක්ෂ 43 කින්, රුපියල් දශ ලක්ෂ 225 දක්වා පහළ බැස්සේය ආනයනය කරන ලද කුළු බඩුවල වටිනාකම ද රුපියල් දශ ලක්ෂ 24 කින් රුපියල් දශ ලක්ෂ 69 දක්වා පහළ බැස්ස නමුත්, ආනයනය කරන ලද පිටි වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 80 කින්, රුපියල් දශ ලක්ෂ 217 දක්වා ඉහළ ගියේය. ආනයනය කරන ලද කිරි නිෂ්පාදන, මාලු. සකසන ලද මාලු සහ බීම වර්ගවල වටිනාකම්ද විවිධ ප්‍රමාණයන්ගෙන් පහළ වැටින. ආනයනය කරන ලද රෙදි පිළි වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 72 පමණ ප්‍රමාණයකින්, රුපියල් දශ ලක්ෂ 111 දක්වා අඩු වූ අතර, ආනයනය කරන ලද බෙහෙත් වර්ගවල වටනාකම රුපියල් දශ ලක්ෂ 12 කින්, රුපියල් දශ ලක්ෂ 22 දක්වා පහළ බැස්සේය. මේ හා සසඳ බැලීමේදී, අන්තර් භාණ්ඩ වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 15 කින් ද, ආයෝජන භාණ්ඩ වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 8 කින් ද ඉහළ ගිය බව පෙනේ. ආනයනය කරන ලද පොහොර වර්ග, රසායන ද්‍රව්‍ය, යකඩ, වානේ සහ යන්ත්‍ර සූත්‍රවල ආනයන වටිනාකම් වැඩිවීම් ද සටහන්ව ඇත.

1967 ආනයන වටිනාකම පසුගිය වර්ෂයේ ආනයන වටිනාකම් මට්ටමේම පවත්වා ගැනීමට ලංකාවට ඇති හැකියාව, 1966 රුපියල් දශ ලක්ෂ 224 සිට 1967 රුපියල් දශ ලක්ෂ 258 දක්වා රට තුලට ගලා ආ වඩා විශාල ප්‍රමාණයක ආධාර මගින් පවත්වා ගැනීමේ පහසුකම සැලසිනි. මෙසේ ලබාගත් ආධාර වලින් සැලකිය යුතු ප්‍රමාණයක්, ප්‍රාග්ධන භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ආනයනය සඳහා යොමු කරන ලද නමුත්, සමහර අවසථා වලදී, අත්‍යාවශ්‍ය පාරිභෝජන භාණ්ඩ, විශේෂයෙන් ආහාර වර්ග ද, මෙයින් ලබා ගන්නා ලදී. 1967 දී, ආධාර මුදල් වලින් ආනයනය කරන ලද යන්ත්‍ර සූත්‍ර වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 92. ක්වූ බව පෙනේ, මෙම මුදලින් රුපියල් දශ ලක්ෂ 33.5 ක් ආධාර යෝජනා ක්‍රම ආනයනය සඳහා

වන අතර, රුපියල් දශ ලක්ෂ 58 ක් භාණ්ඩ ආධාර ආනයන සඳහා විය. භාණ්ඩ ආධාර සැලැස්මවල් යටතේ, රුපියල් දශ ලක්ෂ 43 ක් වටිනා පෝර විශී ද ආනයනය කරන ලදී. (1967 කරන ලද එවැනි ආනයන වල වටිනාකමෙන් අඩක් පමණ) භාණ්ඩ ආධාර සැලැස්මවල් යටතේ ලබා ගන්නා ලද ප්‍රවාහණ උපකරණ වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 55 ක් විය එවැනි සැලැස්මවල් යටතේ ලබා ගන්නා ලද වෙනත් භාණ්ඩ වලට, පිටි (රුපියල් දශ ලක්ෂ 24) මාලු සහ සකසන ලද මාලු (රුපියල් දශ ලක්ෂ 4) සහ බෙහෙත් වර්ග (රුපියල් දශ ලක්ෂ 1) ඇතුළත් වෙයි.

(ආ) අදිසි ගිණුම

1965 දී අදෘශයන් සම්බන්ධයෙන් ලංකාවට රුපියල් දශ ලක්ෂ 72 ක් පමණ අතිරික්තයක් තිබුණි. 1966 මෙම අතිරික්තය රුපියල් දශ ලක්ෂ 53 දක්වා පහළ වැටුණු අතර, 1967 දී මෙය තව දුරටත් රුපියල් දශ ලක්ෂ 21 දක්වා සංකෝචනය වුනි. පසුගිය වර්ෂ කිහිපය තුල ආදෘශ්‍යයන් පිළිබඳ ගිණුමේ මුළු ලැබීම් ප්‍රමාණය, සාමාන්‍ය වශයෙන් සථාවරව පැවති අතර, මෙම ගිණුමේ එන දීමනා වැනි සමහර කොටස් හි පහළ බැසීම තවදුරටත් සිදු වීය. උදාහරණයක් වශයෙන් 1965 රුපියල් දශ ලක්ෂ 64 සිට 1967 රුපියල් දශ ලක්ෂ 46 දක්වා පහළ වැටිණි. ලැබුණු දීමනා සම්බන්ධයෙන් ඇති වූ කැපී පෙනුන සංකෝචනය "වෙනත් සේවාවන්ගෙන්" ලද වැඩි වූ ලැබීම් වලින් ස්වල්ප ප්‍රමාණයකින් පියවා ගැනීමට හැකි විය.

අදිසි ගිණුමේ, ගෙවීම් පිළිබඳ පරිමාවේ ප්‍රවණතාවය, මෑත අවුරුදු වලදී ඉහල ගියේය. ආයෝජන ආදායම් පිළිබඳව පැවති මුදල් පිටරට යැවීමේ බාධක ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, දිවයිනෙන් පිටතට මුදල් ගලා යෑම, 1965 රුපියල් දශ ලක්ෂ 4 සිට 1966 රුපියල් දශ ලක්ෂ 26 දක්වාත්, 1967 දී රුපියල් දශ ලක්ෂ 34 දක්වාත් වැඩි විය. ආවෘත අරමුදල් වලින්, 1965, 1966 සහ 1967 යන වර්ෂයන්හි දී පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 6, රුපියල් දශ ලක්ෂ 29 සහ රුපියල් දශ ලක්ෂ 42 ක ප්‍රමාණයක්, නියම වශයෙන් මුදා හරින ලදී. ලංකාවේ විදේශීය ණය ගැති භාවය වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, පොලී ගෙවීම් ප්‍රමාණයද වැඩි විය. 1967 දී එවැනි ගෙවීම් වල ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ (24) ක් විය. විගමනිකයන්ගේ වත්කම් මාරු කිරීම් වල වාර්ෂික සාමාන්‍ය වටිනාකම, රුපියල් දශ ලක්ෂ 30 ක් විය. මේ අනුව, ආයෝජන ආදායම්, විගමනිකයන්ගේ මුදල් යැවීම් සහ පොලීගෙවීම් ආදල, වැඩිවන වත්කම් මාරු කිරීම් පරිමාවට සරිලන පරිදි මූල්‍ය අවශ්‍යතා සපයා ගැනීමට, ලංකාවට ඇති හැකියාව රඳා පවත්නේ, එයට අනුරූප වශයෙන්, ප්‍රවාහණ සේවයන්, දේශ සංචාරක සේවයෙන් සහ දීමනා වශයෙන් ලැබෙන ධන සම්පත් වල වැඩිවීමේ ප්‍රමාණය මතය.

වරාය හා හාර්බ ගාස්තු වෙනුවෙන් ලැබෙන ලැබීම්, ලංකාවේ අදිසි ගිණුමේ ප්‍රධාන විදේශීය විනිමය උපයන මාර්ගය වශයෙන් දිගටම පැවැත්තේය. මෑත වර්ෂයන්හි දී කොළඹ වරායට පැමිණෙන නැව් සංඛ්‍යාව අඩුවීම නිසා 'මෙම මාර්ගයෙන් ලැබෙන ආදායම් ප්‍රමාණය අඩු වී යාමට හේතු වූවත්, නැවත වරක් මෙම ආදායම් වැඩි වීමේ ප්‍රවණතාවයක ලක්ෂණයක් දක්නට ඇත. උදාහරණයක් වශයෙන් වරාය හා හාබර් ගාස්තු වෙනුවෙන් ලද ලැබීම් 1965 දී රුපියල් දශ ලක්ෂ 100 සිට 1967 දී රුපියල් දශ ලක්ෂ 107 දක්වා වැඩි විය. මෙම ගිණුමේ අතිරික්තය, 1965 දී රුපියල් දශ ලක්ෂ 96 සිට, 1966 රුපියල් දශ ලක්ෂ 108 දක්වා වැඩි වූ නමුත්, 1967 දී රුපියල් දශ ලක්ෂ 106 දක්වා පහළ වැටිණි. දී ඇති පහසුකම්වල දියුණුවත්, භාණ්ඩ ආදිය හසුරුවා ලීමේ කාර්යක්ෂමතාවය වැඩිවීමත් නිසා විදේශීය නැව් සමාගම් ආදියට ගෙවන ලද ප්‍රමාද වීමේ නැව් ගාස්තු හැකිතාක් දුරට අඩුකර ලීමට උපකාර වූ බවටත්, එමගින් විදේශීය විනිමය ඉතිරි කර ගැනීමට හැකි වූ බවටත්

කිසිම සැකයක් නැත. පසුගිය වර්ෂය හා සසඳා බලන කල, 1967 වරාය ගාස්තු වශයෙන් ලැබිය යුතු ආදායම් සීමිත වීමට හේතු වූයේ, 1967 පැවති මැද පෙරදිග අර්බුදයත්, ඉන් අනතුරුව සූවස් තුඩුව හරහා නැව් ගමනා ගමන මාර්ගය හැරවීමත් හේතු කොටගෙන, කොළඹ වරායට පැමිණෙන නැව් සංඛ්‍යාව අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

මෑත වර්ෂ වලදී දේශ සංචාරක සේවයෙන් ලැබෙන ආදායම් සුලු ප්‍රමාණයකින් හෝ වැඩිවීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. මෙහි පදනම ඉතාමත් කුඩා වූ නිසා සියයට ගණනක් වශයෙන් දක්වතොත් මේම වැඩිවීම සැලකිය යුතු වැඩිවීමකි. මේ අනුව, 1964 හා 1965 මෙම ගිණුමේ ඉපැයුම් රුපියල් දශ ලක්ෂ 5·6 ක්වූ නමුත්, 1966 දී සියයට 16 කින්, රුපියල් දශ ලක්ෂ 6·5 දක්වා ද, 1967 දී තවදුරටත් සියයට 15 කින්, රුපියල් දශ ලක්ෂ 7·5 දක්වා ද වැඩි වූ බව පෙනේ. ලංකාවේ දේශ සංචාරක පදනම් ව්‍යුහය දියුණු කිරීම සඳහා වෙනත් සම්බන්ධිය විධිවිධානයක් හා සමග, දනට ගෙන ඇති ක්‍රියා මාර්ගයන් උපයෝගී කර ගැනීමෙන්, නීත්‍යානුකූල මාර්ගයන් මගින් විදේශ විනිමය යෙදවීම පිණිස, දේශ සංචාරකයින් පොළඹවා ලීමෙන්, මෙම මාර්ගයෙන් ලැබෙන ආදායම් ප්‍රමාණය වැඩි කිරීමට හැකිවනු ඇත.

සංඛ්‍යා සටහන II (ඊ) 3

ජංගම අඩිසි 1966 සහ 1967

රුපියල් දශලක්ෂ

| | 1966 | | | 1967 | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **සේවා** | 203·4 | 185·8 | + 16·6 | 192·3 | 192·6 | − 10·3 |
| මුදල් නොවන රන් සංචලන (ශුද්ධ) .. | – | 1·8 | − 1·8 | – | 1·7 | − 1·7 |
| ප්‍රවාහනය .. .. .. | 116·5 | 23·6 | + 92·9 | 112·0 | 21·4 | + 87·6 |
| සංචාර .. .. .. .. | 6·5 | 15·9 | − 9·4 | 7·5 | 16·8 | − 9·3 |
| ආයෝජන ආදයම .. .. | 12·9 | 49·7 | − 36·8 | 10·6 | 65·3 | − 54·7 |
| අවක්‍ර ආයෝජන .. .. .. | 1·8 | 24·6 | − 22·8 | 0·8 | 32·2 | − 31·4 |
| අනෙකුත් .. .. .. | 11·1 | 25·1 | − 14·0 | 9·8 | 33·1 | − 23·3 |
| රජයේ වියදම් .. .. .. | 29·1 | 16·7 | + 12·4 | 25·2 | 12·6 | + 9·6 |
| අනෙකුත් සේවා .. .. .. | 38·4 | 79·1 | − 40·7 | 37·0 | 76·1 | − 40·1 |
| **සංක්‍රම ගෙවුම්** .. .. | 68·9 | 32·3 | + 36·6 | 52·5 | 30·1 | + 22·4 |
| පෞද්ගලික ගෙවුම් .. .. | 6·0 | 32·3 | − 26·3 | 6·6 | 30·1 | − 23·5 |
| නිල ගෙවුම් .. .. .. | 62·9 | — | + 62·9 | 45·9 | – | + 45·9 |
| එකතුව .. .. .. | 272·3 | 219·1 | + 53·2 | 244·8 | 222·7 | + 22·1 |

## (ඇ) රාජ්‍ය විදේශීය වගකීම්

දීර්ඝ කාලීන ප්‍රාග්ධන ලැබීම් (දීමනා හැර) ප්‍රමාණය 1966 දී රුපියල් දශ ලක්ෂ 173·7 ක්වූ අතර, 1967 එහි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 211·8 කි. මෙයින් යෝජනා ක්‍රම ආධාර රුපියල් දශ ලක්ෂ 33·5 ක්වූ අතර, 1966 රුපියල් දශ ලක්ෂ 55 කි. භාණ්ඩ ආධාර (දීමනා හැර) ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 178·3 ක් (1966 රුපියල් දශ ලක්ෂ 118·7 කි) විය. 1966 රුපියල් දශ ලක්ෂ 30 හා සසඳන කල, කලින් ණය නැවත ගෙවීම් රුපියල් දශ ලක්ෂ 44·5 ක් විය. මේ නිසා පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 143·5 හා සංසන්දනය කරන කල, දීර්ඝ කාලීන ප්‍රාග්ධනය (දීමනා හැර) සම්බන්ධ ශුද්ධ ශේෂය ලංකාවට වාසිවන ලෙස, රුපියල් දශ ලක්ෂ 167·3 ක ප්‍රමාණයක් දක්විය. 1967 දී ලැබුණු යෝජනා ක්‍රම ආධාර අර්ථ ක්‍රමයෙහි පදනම් ව්‍යුහයේ ආයෝජන වියදම් සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදී. ග්‍රාන්ඩ්පාස්හි

තාපබල යෝජනා ක්‍රමය, (රුපියල් දශ ලක්ෂ 4) මස්කෙළිය ඔය ජල විදුලි බල යෝජනා ක්‍රමය, (රුපියල් දශ ලක්ෂ 10·1), කටුනායක ගුවන් තොටුපල යෝජනා ක්‍රමය (රුපියල් දශ ලක්ෂ 5·7) සහ මහනුවර ජල සම්පාදන යෝජනා ක්‍රමය ඒවා අතර විය. මීට අමතරව යෝජනා ක්‍රම ආධාර, වානේ සහ ටයර් සංස්ථාවලට ද, ට්‍රොලර් මිලට ගැනීම සඳහා ධීවර සංස්ථාවට ද, ලෝහ භාණ්ඩ සංස්ථාවට හා ටැලිපෝන් උපකරණ ලබා ගැනීම විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සඳහා ද වෙන් කරනු ලැබිණි. සිමෙන්ති හා වානේ කම්හන්තශාලා වලට ද කොළඹ වරායට ද යෝජනා ක්‍රම ආධාර 1967 දී ලැබිනි.

1967 වර්ෂය අවසානයේ දී, පළවෙනි, දෙවෙනි හා තුන්වෙනි භාණ්ඩ ආධාර වැඩ පිළිවෙළවල් යටතේ ලැබුනු මුළු භාණ්ඩ ආධාර ප්‍රමාණය (දීමනා සමග) රුපියල් දශ ලක්ෂ 335 ක් විය. මෙම ආධාර වලින් වැඩි කොටසක් ආයෝජන හා අමු ද්‍රව්‍ය සඳහා යොමු කළ අතර, 1967 වර්ෂයේ එය විශේෂයෙන් කැපී පෙනුනි. 1967 ලැබුණු භාණ්ඩ ආධාර ප්‍රමාණය (දීමනා ඇතුළු) රුපියල් දශ ලක්ෂ 208 ක්වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 184 ක් ණය සහ රුපියල් දශ ලක්ෂ 24 ක් දීමනා විය. ඉහත ද පෙන්වා දී ඇති පරිදි මෙම ආධාර වලින් වැඩි කොටසක් ලැබුනේ ආයෝජනා හා අමු ද්‍රව්‍ය වශයෙනි. 1965 දී කතිකා කර නියම කරගත් පළවෙනි ආධාර වැඩ පිළිවෙල යටතේ, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව ලබා දුන් භාණ්ඩ ආධාර හැර, සාමාන්‍යයෙන් මෙම ණය ආධාර එසේ දුන් රටින් ගන්නා මිලදී ගැනීම් වලට බැඳී ඇත. 1967 ලැබුණු භාණ්ඩ ආධාර වලින් රුපියල් දශ ලක්ෂ 50·6 ක් (සියයට 24 ක්) එක්සත් රාජධානියෙන් ද, රුපියල් දශ ලක්ෂ 49·3 ක් (සියයට 23 ක්) ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ද, රුපියල් දශ ලක්ෂ 28·0 (සියයට 13 ක්) ජර්මන් ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුවෙන් ද, රුපියල් දශ ලක්ෂ 21·7 ක් (සියයට 10 ක්) ප්‍රංශයෙන් ද, රුපියල් දශ ලක්ෂ 19·9 ක් (සියයට 9 ක්) ජපානයෙන් ද, රුපියල් දශ ලක්ෂ 5·4 ක් ඉන්දියාවෙන් ද, රුපියල් දශ ලක්ෂ 3·1 ක් කැනඩාවෙන් ද ලැබුනි. සපයන ලද භාණ්ඩ වලින් වැඩි ප්‍රමාණයක් යන්ත්‍රෝපකරණ, මෝටර් රථ අමතර කොටස්, ගොඩනැගිලි උපකරණ, ඉංජිනේරු භාණ්ඩ වර්ග, කාර්මික අමු ද්‍රව්‍ය, ට්‍රැක්ටර් සහ පොර වර්ග වලින් සමන්විත වූයේය.

1967 දී, ද්විපාර්ශ්වීය ගෙවීම් ගිවිසුම් යටතේ පැවති ලංකාවේ ණය ප්‍රමාණය 1966 පැවති රු. දශ ලක්ෂ 30 සිට රුපියල් දශ ලක්ෂ 110 තෙක් ඉහළ ගියේය. මෙම ගිණුමේ, විදේශීය වගකීම් රුපියල් දශ ලක්ෂ 80 කින් වැඩිවීමට මූලික වශයෙන් හේතු වූයේ සෝ. ස. ස. සං. ට ඇති වගකීම් වැඩිවීමයි. මේ වගකීම් 1966 අවසානයේ පැවති, රුපියල් දශ ලක්ෂ 26.5 සිට 1967 අවසානයෙහිදී රුපියල් දශ ලක්ෂ 91.7 දක්වා, එනම්; රුපියල් දශ ලක්ෂ 65.2 කින් ඉහළ ගියේය. 1967 දී සෝ. ස. ස. සං. සමග පැවති ගෙවුම් හිඟය වැඩිවීමට හේතු වූයේ, ලංකාවෙන් ලබා ගත් ආනයනවල අඩුවීමත්, ලංකාව කළ ආනයන වැඩිවීමත් නිසාය. සෝ. ස. ස. සං. සම්බන්ධයෙන් ණය ක්‍රමසංග්‍රය පිළිබඳ රුපියල් දශ ලක්ෂ 11.5 ක බේරුම් කිරීමක් ද විය.

1967 දෙසැම්බර් අවසානයේදී අන්තර් ජාතික මූල්‍ය අරමුදලෙන් කළ දළ හැර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 122.6 ක්වූ අතර, දැනට ඇති මුළු හැර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 470.2 (එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ - 17.9) කි. 1967 දී අන්තර් ජාතික මූල්‍ය අරමුදලෙක කළ නැවත මිලදී ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17.9 ක් විය. මේ නිසා 1967 දී මෙම අරමුදලෙන් කළ ශුද්ධ හැර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 104.7 කි. 1967 දී ගනු ලැබූ ණය මුදල් ප්‍රමාණයෙන්, රුපියල් දශ ලක්ෂ 92.8 ක් ලබාගත්තේ 1967 මාර්තු 21 වෙනිදාය. මෙය, අපනයන ඉපැයීම්හි උච්ඡාවචනයන් වෙනුවෙන් අරමුදල යටතේ පවතින, වන්දි පියවීමේ මූල්‍ය පහසුකම් යටතේ ලබාගත් ණය ප්‍රමාණයයි.

1966 ජූනි පටන් වර්ෂයක කාල වෙඡදයකට අන්තර් ජාතික මූල්‍ය අරමුදලෙහි දෙවැනි සම්පසථ ගිවිසුම යටතේ වූ, රුපියල් දශ ලක්ෂ 29.8 ක් අවසාන ණය කොටස ලංකාව විසින් 1967 මාර්තු 29 වෙනි දින ණයට ගන්නා ලදී. 1965 ජූනි ආරම්භයේ පටන්, පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 30 ක් සහ දශ ලක්ෂ 25 ක් වෙනුවෙන් අන්තර් ජාතික මූල්‍ය අරමුදල සමග ඇති කර ගත් සම්පස්ථ ගිවිසුම් දෙකක් අනු පිළිවෙලින් අවසන් කළේය. පළමුවෙනි සම්පස්ථ ගිවිසුමෙන්, ලංකාව එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 22.5 ක් ප්‍රයෝජනයට ගත්තේය.

### සංඛ්‍යා සටහන II (ඊ) 4

### ලංකාවේ රාජ්‍ය විදේශීය වගකීම් (දළ) 1

රුපියල් දශ ලක්ෂ

| | වර්ෂය අවසානයට ගෙවීමට ඇති | | |
|---|---|---|---|
| | 1966 | 1967 | වෙනස |
| 1· ලංකාවෙන් අය විය යුතු ගෙවීම් ගිණුම් ශේෂ .. .. | 30·2 | 110·3 | + 80·1 |
| 2· ජා· මු· අරමුදලෙන් ගත් ණය .. .. | 271·4 | 376·1 | + 104·7 (2) |
| 3· රන් පවුම් ණය .. .. .. | 83·3 | 83·3 | — |
| 4· ණයට ගෙන පියවා නොමැති විදේශීය ණය .. | 438·3 | 428·6 | — 9·7 (3) |
| 5· සහභාගී රටවල ආධාර .. .. .. | 118·6 | 296·6 | + 178·0 (4) |
| 6· ආහාර කොමසාරිස්ගේ විලම්බිත බදු .. .. | 30·6 | 23·8 | — 6·8 |
| 7· විදේශ බැංකු වලින් කළ ලබාගැනීම් .. .. | — | 57·1 | + 57·1 |
| එකතුව .. | 972·4 | 1,375·8 | + 403·4 |

(1) විදේශීය විනිමය වලින් ගෙවීමට ඇති වගකීම් වලට ජන නීති 480 යටතේ ඇති ප්‍රතිපාර්ශ්විය අරමුදල් ශේෂ සහ වෙළෙඳ බැංකු වෙතැති අතේවාසි ඇතුළත් නොවේ. එවැනි ශේෂ 1967 දී රුපියල් දශ ලක්ෂ.......... සිට රුපියල් දශ ලක්ෂ........ දක්වා රුපියල් දශ ලක්ෂ........... කින් අඩුවිය·

(2) රුපියල් දශ ලක්ෂ 122·6 ක ණය ගැනීම් සහ කලින් ගත් ණය ගැනීම් වලින් රුපියල් දශ ලක්ෂ 17·9 ක ප්‍රති මිලට ගැනීම් ඇතුළත්ය.

(3) ජා· ප්‍ර· ස· බැංකුව, ඇමරිකා එක්සත් ජනපදය සෝවියට් සංගමය, චීනය, ජර්මන් ෆෙඩරල් ජන රජය, කැනඩාව, පෝලන්තය, ප්‍රංශය සහ යුගෝස්ලේවියාවෙන් ලබාගත් ණය මුදල් ඇතුළත්ය·

(4) 1965, 1966 සහ 1967 වර්ෂවල වැඩ සටහන් යටතේ එක්සත් රාජධානියෙන්, ජර්මන් ජනරජයෙන්, ජපානයෙන්, ඉන්දියාවෙන් හා කැනඩාවෙන් ලැබුණු භාණ්ඩාධාර ඇතුළත්ය·

## (ඉ) විදේශීය සංචිත

1967 දෙසැම්බර් අවසානයේදී, ලංකාවේ දළ විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 448.9 ක් විය. මෙයින් රුපියල් දශ ලක්ෂ 41.9 ක් සැකසුනේ ස්ටර්ලින් ණය නිදන් අරමුදල් වලිනි.[1] මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත රුපියල් 260.4 ක් වූ අතර, රජයේ හා රාජ්‍ය නියෝජිත ආයතන සහ අනෙක් ආයතන වල සංචිත ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 68.6 ක් විය. වෙළඳ බැංකුවල විදේශීය ශේෂ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 119.9 කි.

1967 දී ලංකාවේ විදේශීය වත්කම් (ස්ටර්ලින් ණය හා නිදන් අරමුදල්වල ශුද්ධ ප්‍රමාණය) රුපියල් දශ ලක්ෂ 125.1 කින් ඉහළ ගියේ; ගෙවුම් ශේෂයේ රුපියල් දශ ලක්ෂ 176 ක මූලික හිඟය ද නැති කරමින් සංචිතයන් මෙසේ බලාපොරො-

3 නිදන් අරමුදල්වල වත්කම් ගෙවුම් ශේෂයේ පියවීම සඳහා ප්‍රයෝජනයට ගත නොහැකිය

ත්තු නොවූ සේ වැඩිවීම, මුළුමනින්ම පාහේ 1967 දී නොයෙක් ණය ගැණීම් සඳහා වූ වැඩ පිළිවෙලවල් විශේෂයෙන් දෙසැම්බර් මාසයේ දී ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵල නිසා සිදු වූවකි. උදාහරණයක් වශයෙන් වර්ෂය අවසානයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ හැර ගැනීම් රුපියල් දශ ලක්ෂ 184.7 කින් වැඩි වී, විදේශීය බැංකු වලින් කළ ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 57.1 කින් තව දුරටත් ඉහළ ගොස්, ගෙවීම් ගිවිසුම් යටතේ වූ වගකීම් ද රුපියල් දශ ලක්ෂ 80.1 කින් වැඩි විය. මෙම වගකීම් සඳහා අඩු කිරීම් ඇති කළා නම්, ඇත්ත වශයෙන් ම විදේශීය වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12.1 කින් පහළ යාමක් වන්නට තිබුණි.

1967 නොවැම්බර් 22 වැනි දින සියයට 20 කින් ලංකාවේ රුපියල අවප්‍රමාණ කිරීම් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ රුපියල් අනුව සංචිත ප්‍රතිප්‍රමාණය කිරීම (දිස්වූ) විදේශීය වත්කම් ප්‍රමාණයෙහි වැඩිවීමක් වර්ෂය තුළ දී පෙනීමට හේතු වූ තවත් සාධකයක් විය. ලංකාවේ රුපියල් අනුව ප්‍රතිප්‍රමාණ කළ විට ලංකා රුපියල් වලින් රුපියල් දශ ලක්ෂ 19.9 කට කිට්ටු ප්‍රමාණයක් ලංකාවේ විදේශීය වත්කම් වලට එකතු විය කෙසේ වෙතත් 1967 තුළ පැවති, සංචිතයන්හි ත්‍රෛමාසික සාමාන්‍යය 1967 සිව් වැනි කාර්තුවේ දී හැර, සාමාන්‍ය වශයෙන් 1966 වර්ෂයේ එම සැලැස්ම පැවති සාමාන්‍යයයට වඩා බොහෝ සේ පහළ මට්ටමක පැවතුනි. මේ කාලච්ඡේදයේ දී සංචිතයන් එක් රැස් කරන ලද්දේ මූලික වශයෙන් වර්තන ගිණුමෙහි හිඟව ඇති වගකීම් පියවීමේ අභිලාෂයෙනි.

## (ඡ) රුපියල අවප්‍රමාණය කිරීම.

1967 නොවැම්බර් 22 වැනි ද ලංකාවේ රුපියල සියයට 20 කින් අවප්‍රමාණය කිරීමේ තීරණය උද්ගත වූයේ ලංකා රුපියල අධි-අගයක තැබීමට තුඩු දුන් දිගු කාලීන සාධකවල ප්‍රතිඵලයක් වශයෙන් හා 1967 නොවැම්බරයේ දී එංගලන්ත පවුම අවප්‍රමාණය කිරීම, හේතු කොට ගෙනය. දිගු කාලීන වශයෙන් බැලීමේදී, කලක සිටම ලංකාවේ පැවති මූල්‍ය - පිස්කල් අසමතුලිතතාවයෙහි ප්‍රසාරණාත්මක බලපෑම හේතු කොට ගෙන, එක් අතකින්, දැඩි ආනයන හා විනිමය පාලනයන් ඇති කිරීමත්, අනෙක් අතින් විදේශ විනිමය විනාශයට තුඩු දුන්, ආනයනයන් අධි ඉන්වොයිසි කිරීම හා අපනයනයන්හි අව ඉන්වොයිසි කිරීම් සිදුවන තත්ත්ව-යන් මතුවීමත් පෙනීන.

මිල හා වියදම් විශේෂයෙන්ම අපනයන අංශයෙහි දේශීය වශයෙන් ඉහළ යාම, ලංකාවේ තරඟ කාරී හැකියාව ක්‍රමයෙන් හීන කළේය. මේ නිසා ආයතන වල ඉල්ලුම් සීමා කිරීම, කෘෂිකර්මයේ සහ කර්මාන්තවල ආනයන ආදේශනයට වඩාත් පෙළඹවීමක් ඇති කිරීම හා අපනයනිකයන්ට යම් සහනයක් ලබා දීම යන බලාපොරොත්තු දෙකම වඩාත් අගේ කොට සලකන්නට යෙදුන නිසා අධි අගැයීමක පැවති, විනිමය අනුපාතිකයන්හි ගැලපිලි කිරීමක් අවශ්‍ය බව පෙනීන

එක්සත් රාජධානියේ පවුම අවප්‍රමාණ කිරීම නිසා, කෙදිනක හෝ අපනයන ආදායම් පිළිබඳ අහිතකර විපාක සමඟ ලංකාවේ විනිමය අනුපාතිකයේ දුර්වලකම තියුණු ලෙස පිළිබිඹු වේ යයිද හැඟුනි.